**පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව - 2017**

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 7(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළයුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ නියාමන සභාවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 7(1) වගන්තිය ප්‍රකාරව, පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව, සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු බව සඳහන් කර තිබුණි. ඒ අනුව 1971 අංක 38 දරන මුදල් පනත මෙම සභාව සඳහා වලංගු වන බැවින් එම පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව වාර්ෂික ගිණුම් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

නියාමන සභාව විසින් අවසන්වරට පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, හිමිකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 26,787,266 |
| ජංගම වත්කම් | 17,424,501 |
| මුළු වත්කම් | 44,211,767 |
| | |
| ජංගම නොවන බැරකම් | - |
| ජංගම බැරකම් | 21,688,895 |
| මුළු බැරකම් | 21,688,895 |
| ශුද්ධ වත්කම් / හිමිකම් | 22,522,872 |
| එකතුව | 44,211,767 |

| | |
|---|---|
| මුළු ආදායම | 18,056,343 |
| මුළු වියදම | (19,995,419) |
| ඌනතාවය | (1,939,076) |

**2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

2017 දෙසැම්බර් 31 දිනට පැවති මුහුණත අගය රු.10,440,000 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සහතික හා 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ශේෂය තහවුරු කිරීමේ ලිපි මෙම වාර්තාවේ දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නියාමන සභාව විසින් 2017 දෙසැම්බර් 31 දින වනවිට රු.35,085,716 ක් ස්ථාවර තැන්පතුවලද රු.10,000,000 ක් භාණ්ඩාගාර බිල්පත් වලද ආයෝජනය කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 225(4) | වවුචර් පිලියෙල කරන හෝ ඒවායේ හරි වැරදි බලන හෝ යටත් නිලධාරින් ඒවායේ කෙටි අත්සන සඳහා ඉඩ තබා ඇති ස්ථානයන්හි සිය කෙටි අත්සන තැබිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී රු.992,793 ක වවුචර්වල කෙටි අත්සන් යොදා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 231(1) | හැකිතාක් දුරට වෙනත් ලේඛනයක් නොබලා හරි වැරදි බැලීමට හැකිවනු පිණිස සෑම සේවයක් පිළිබඳවම දින, සංඛ්‍යා, ප්‍රමාණ, දුර, ගාස්තු ප්‍රමාණ ආදී සම්පූර්ණ විස්තර සියලුම වවුචර්වල අඩංගු විය යුතු නමුත්, සමාලෝචිත වර්ෂයේදී රු.336,177 ක සුළු මුදල් ප්‍රතිපූර්ණ කිරීමේදී වියදම් සනාථ කෙරෙන බිල්පත් හා කුවිතාන්සි වවුචරය සමග අමුණා නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 245(1) | සහතික කරන නිලධාරියා විසින් සියළුම වවුචර් සහතික කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රු.619,222 ක වවුචර් සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| | (iv) මුදල් රෙගුලාසි 262(2) | ගෙවන ලද සියළුම වවුචර්වලත් ඒවා තහවුරු කෙරෙන ලියවිලිවලත් ගෙවන ලදී මුද්‍රාව යෙදිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රු.20,372,698 ක වවුචර්වල ගෙවන ලදී මුද්‍රාව නොතබා ගෙවීම් කර තිබුණි. |
| | (v) මුදල් රෙගුලාසි 384(3) | ලැබෙන සෑම චෙක්පොතක් පිළිබඳවම විස්තර උප පත්‍රිකා පොත් ලේඛනයක සටහන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (vi) මුදල් රෙගුලාසි 395 | එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද, නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (vii) මුදල් රෙගුලාසි 431 (3) | සුරැකුම්පත්වල සම්පූර්ණ විස්තර එනම් ප්‍රකාශන අගය, ගැනුම් මිල, විකිණීමෙන් ලත් මුදල, ප්‍රතිඵල ලාභය හෝ අලාභය, ලාභාංශ, ලාභාංශ ලැබුණු දිනය ආයෝජන ලේඛනයක වාර්තා කළ යුතු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආයෝජන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා මෘදුකාංග සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2017 නොවැම්බර් 02 දිනැති අංක 04/2017 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | 2017 වර්ෂයේ මුදල් පොත පියවා තම නම, අත්සන, තනතුර, දිනය සහ වේලාව සහිත සටහනක් තැබිය යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දිනට එලෙස මුදල් පොත පියවා නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 3.1 කාර්යසාධනය
-------------------

#### 3.1.1 සැලසුම් කිරීම
-----------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව, ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද නියාමන සභාව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් සභාවේ කාර්යසාධනය පිළිබඳ අදහසක් ඉදිරිපත් කළ නොහැකි විය. කෙසේ වෙතත් නියාමන සභාව ආරම්භ කළ 2007 වර්ෂයේදී ලියාපදිංචි කර තිබුණු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 1,747 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම සංඛ්‍යාව 712 ක් දක්වා එනම් සියයට 59 කින් අඩුවී තිබුණි. එලෙස ලියාපදිංචිය අඩුවීමට හේතුව එම පෞද්ගලික වෛද්‍ය ආයතන වසා දැමීමද නැතහොත් ලියාපදිංචිය ලබා නොගෙනම ආයතන පවත්වාගෙන යාමද යන්න පිළිබඳව පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

(ආ) 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 2(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචිවී තිබුණු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 712 ක් පමණක් විය. කෙසේ වුවද ලියාපදිංචි වියයුතු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 9 වගන්තියේ දැක්වෙන පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත්වී තිබුණි.

(i) ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීම හා අධීක්ෂණය කිරීම

(ii) සියළු පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීම හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීම

(iii) ඒ ඒ පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පිරිනමනු ලබන හෝ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීම

(ඈ) 13(1) වගන්තිය ප්‍රකාරව, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඉ) 18(2) උප වගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව ,පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේදී හා එම ලියාපදිංචිවීම් අලුත් කිරීමේදී පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු නියමු උපදේශන පිළියෙල කිරීම කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඊ) 18(2) උප වගන්තියේ (උ) ඡේදය ප්‍රකාරව, සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තෙකුට විරුද්ධව කරනු ලබන යම් පැමිණිල්ලක් භාර ගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටි හෝ පරිචයන් පිළිබඳ නියෝග පිළියෙල කිරීම කළ යුතු වුවද එසේ කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජුනි 11 දිනැතිව ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව, නියාමන සභාව විසින් එකතු කරනු ලබන වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් පළාත් සභාවලට ලබාදීමට ප්‍රථම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධනයට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සමඟ වාර්ෂික යෝජනාවක් ඉදිරිපත් කළ යුතු බවට හා වර්ෂය අවසානයට වියදම් හා ක්‍රියාකාරකම් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට වූ විධිවිධාන ඇතුළත් කරමින් 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 3(5) වගන්තිය සංශෝධනය කිරීමට 2015 ජූලි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී වර්ෂ 03 ක් ගතවී තිබුණද පනත සංශෝධනය කර නොතිබුණු අතර වාර්ෂික ලියාපදිංචි ගාස්තු ආදායමෙන් සියයට 50 ක් පළාත් සභාවලට ලබාදී තිබුණි.

(ආ) වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු නිශ්චිත කාල වකවානුවක් පනතේ හෝ නියමු උපදේශන මගින් සඳහන් කර නොතිබීම හේතුවෙන් වෛද්‍ය ආයතන ලියාපදිංචිය වෙනුවෙන් කවර දිනක හෝ මුදල් ලද පසු අදාළ වර්ෂය සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම සිදු කර තිබුනු අතර දඩ මුදලක් අයකර නොතිබීම හේතුවෙන් වර්ෂය මුලදී සභාවට ලැබිය යුතු ආදායම ප්‍රමාද වී ලැබී තිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළදී අර්ධකාලීන සාමාන්‍ය බෙහෙත් ශාලාවලින් පමණක් නියාමන සභාව වෙත ලැබිය යුතු හිඟ හිටි ලියාපදිංචි ගාස්තු ආදායම රු.700,000 ක් වූ බැව් නියැදි විගණන පරීක්ෂණයකදී අනාවරණය වූ අතර නියාමන සභාව සතුව හිඟහිටි ආදායම් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණි.

## 3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

නියාමන සභාව ආරම්භ කළ වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනයේ කාර්යයභාරය හා ප්‍රමාණය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්යය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ගණකාධිකාරී, මෙහෙයුම් කළමනාකරු හා සහායක තනතුරු 4 ක් ඇතුළුව 09 දෙනෙකු බඳවාගෙන තිබුණි.

## 4. තිරසාර සංවර්ධනය

### 4.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළදිද අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 5.2 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 5.2.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) නියාමන සභාව විසින් නියාමන සභාවේ අළුතින් ලියාපදිංචි වන සියළු පෞද්ගලික වෛද්‍ය ආයතනවල ප්‍රදර්ශනය සඳහා අළුත් නාමපුවරුවක් ලබාදී තිබුණු අතර 2011 නොවැම්බර් 03 දිනෙන් පසුව 2013 ඔක්තෝබර් දෙවනවර ලංසු කැඳවා අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු පළමු කොන්ත්‍රාත්කරු වෙතම කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් 22 දින ප්‍රදානය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එම කොන්ත්‍රාත්කරු වෙතම යලි ඇණවුම් කර මුළු මුදල රු.609,500 ක් ගෙවා නාම පුවරු 246 ක් මිලදීගෙන තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, මුල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දින සිට 6 මසක කාලයක් ඉකුත්ව නැති විට හා මුල් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 50 ක සීමාවක් දක්වා පමණක් භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා නැවත ඇණවුම් කිරීමට හැකියාව තිබේ. නමුත් එම සීමාවන් දෙකම උල්ලංඝනය කරමින් මුල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දිනය වූ 2013 ඔක්තෝබර් සිට මාස 6 ක කාලයක් ඉක්මවීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03 කදී නැවත ලංසු කැඳවීමකින් තොරව එම සැපයුම්කරුගෙන්ම යළි ඇණවුම්කර එකක් රු.2,400 බැගින් කුඩා නාමපුවරු 226 ක්ද, එකක් රු.2,900 බැගින් මධ්‍යම නාමපුවරු 6 ක්ද හා එකක් රු.3,550 බැගින් විශාල නාමපුවරු 14 ක්ද මිලදී ගැනීම සඳහා රු.609,500 ක් වැයකර තිබුණි.

(ඇ) වාර්ෂිකව ලියාපදිංචිය අළුත්කිරීමේදී ලියාපදිංචි නව වර්ෂය සඳහන් කරමින් පැරණි නාමපුවරුවට අළුතින් කොටසක් එකතුකරමින් නැවත සැකසීමට (Refill) කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවස්ථා 11 කදී යලි ඇණවුම් කර නාම පුවරු 982 ක් නැවත සැකසීම (Refill) සඳහා රු.919,820 ක් වැයකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වාර්ෂිකව ලියාපදිංචිය අළුත්කර තිබුණු පෞද්ගලික වෛද්‍ය ආයතනවල පැරණි නාමපුවරු නැවත සැකසීම (Refill) සඳහා අළුත් නාමපුවරු සැපයු සැපයුම්කරු විසින්ම අවස්ථා 2 කදී පහත විස්තර සඳහන් පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| නාමපුවරු වර්ගය | 2012 ජුනි 07 දින ඉදිරිපත් කර තිබුණු ලංසුව | 2012 ජුනි 28 දින ඉදිරිපත් කර තිබුණු ලංසුව |
|---|---|---|
| | රු. | රු. |
| විශාල | 1,250 | 1,050 |
| මධ්‍යම | 990 | 900 |
| කුඩා | 850 | 820 |

නමුත් වෙනත් ආයතනවලින් මේ සඳහා ලංසු කැඳවූ බව හෝ ලංසු ඉදිරිපත් කර තිබුණු බව හෝ සනාථ කිරීමට ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, මුල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ දින සිට 6 මසක කාලයක් ඉකුත්ව නැති විට හා මුල් කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 50 ක සීමාවක් දක්වා පමණක් භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා නැවත ඇණවුම් කිරීමට හැකියාව තිබේ. නමුත් එම සීමාවන් දෙකම උල්ලංඝනය කරමින් 2013 ජුනි සිට මාස 6 ක කාලයක් ඉක්මවීමෙන් පසුව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 11 කදී නැවත ලංසු කැඳවීමකින් තොරව එම සැපයුම්කරුගෙන්ම යළි ඇණවුම්කර එකක් රු.850 බැගින් කුඩා නාමපුවරු 621 ක්ද, එකක් රු.990 බැගින් මධ්‍යම නාමපුවරු 228 ක් හා එකක් රු.1,250 බැගින් විශාල නාමපුවරු 133 ක් නැවත සැකසීම සඳහා රු.919,820 ක් වැයකර තිබුණි.

(iii) 2012 ජුනි 28 දින ඉදිරිපත් කර තිබුණු අවම ලංසුව යටතේ නාමපුවරු අලුත් කිරීමක් සිදුකර නොතිබුණු අතර අවස්ථා 11 කදී වැඩි ලංසුව යටතේ නාමපුවරු අලුත්කිරීම සිදුකර තිබුණි. ඒ අනුව එකකට රු.30 බැගින් කුඩා නාම පුවරු 621 ක් සඳහා රු.18,630 ක්ද, එකකට රු.90 බැගින් මධ්‍යම නාමපුවරු 228 ක් සඳහා රු.20,520 ක්ද සහ එකකට රු.200 බැගින් විශාල නාමපුවරු 133 ක් සඳහා රු.26,600 ක් වශයෙන් මුළු නාමපුවරු 982 ක් සඳහා රු.65,750 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 5.3 අයවැය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයට අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර නියාමන සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | ආයතනයේ කාර්යයභාරය හා ප්‍රමාණය හඳුනාගෙන කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා බඳවා ගැනීමට කටයුතු කර නොතිබීම. |

| | | |
|---|---|---|
| (ආ) | මූලාා පාලනය | (i) බැංකු සැසඳුම් නිසි වේලාවට පිළියෙල කර නොතිබීම හා නිවැරදිව පිළියෙල කර නොතිබීම,<br>(ii) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබීම, මුදල් පොත ක්‍රමවත්ව පවත්වා නොතිබීම<br>(iii) භාණ්ඩාගාර බිල්පත් හා අනෙකුත් ආයෝජන සම්බන්ධයෙන් විධිමත් පරිදි ලේඛන පවත්වා නොතිබීම. |
| (ඇ) | ගිණුම්කරණය | ඇතැම් ගනුදෙනු සඳහා ගිණුම් සංකල්ප පරිදි ද්විත්ව සටහන් නිවැරදිව නොයෙදීම |